සංවිධාන තුළ තොරතුරු පද්ධති

01 කොටස

AAT අදියර II

ISD - ඩිජිටල් පරිසරයක් තුළ තොරතුරු පද්ධති

යොහාන් ධනංජය
Reading for MLRHRM. (UOC), PHDLR. (HRM) (UOC), HRM. (NIBM), BIT Dip. (UOC)

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

ආයතනයක් තුල තොරතුරු පද්ධති

ආයතනයක් තුල තොරතුරු පද්ධති වල විකාශනය

- තොරතුරු පද්ධතියක් යනු නව ව්‍යාපාරික ප්‍රවේශයක් හෝ නව භාණ්ඩ හෝ සේවා සඳහා වන යෝජනා කිරීම්වලට අදාළ තොරතුරු නිර්මාණය කිරීම, සංස්කරණය කිරීම, ගබඩා කිරීම, කළමනාකරණය කිරීම සඳහා ඒකරාශී කරන ලද දෘඩාංග, මෘදුකාංග, ක්‍රියාකාරකම්, පුහුණු පුද්ගලයින්, යටිතල පහසුකම් සහ ප්‍රමිතීන් ගෙන් සමන්විත වූ තනි ඒකකයකි
- එය කාර්යක්ෂම වැඩ පිළිවෙත් සහ සාධනීය සංනිවේදනයක් ඇති කරමින් වඩාත් හොඳ තීරණ ගැනීමක් ආයතනය තුළ ඇති කිරීමට හේතු වේ

ආයතනයක් තුල තොරතුරු පද්ධති වල විකාශනය

1950-1960	1960-1970	1970-1980
දත්ත සැකසීම	කළමණාකරණ වාර්තා මෙවලම්	තීරණ ආධාරක පද්ධති
ආයතනික දෛනික ගනුදෙනු වල දත්ත එක්රැස් කිරීම, ගබඩා කිරීම, නවීකරණය කිරීම සහ නැවත ලබා ගැනීම	තීරණ ගැනීම සඳහා සහාය වීමට වාර්තා උත්පාදනය සහ ඉදිරිපත් කිරීමක්	අන්තර් ක්‍රියාකාරී සහ තත්කාර්ය සහයෝගයක් තීරණ ගැනීම් ක්‍රියාවලි සඳහා ලබා දීම

ආයතනයක් තුල තොරතුරු පද්ධති වල විකාශනය

1980-1990	1990-2000	2000 සිට වත්මන
විධායක ආධාරක පද්ධති	දැනුම් කලමනාකරණ පද්ධති	විද්‍යුත් ව්‍යාපාර
ව්‍යාපාරය උපායමාර්ගික අරමුණු සඳහා අදාල වන අභ්‍යන්තර සහ බාහිර තොරතුරු සැපයීම	ව්‍යාපාරික දැනුම ඇති කිරීම සංවිධානය කිරීම විශ්ලේෂණය කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා උපකාර සැපයීම	පාරිභෝගිකයා සහ ව්‍යාපාරය අතර මනා සම්බන්ධතාවයක් ගොඩ නැගීම, ව්‍යාපාරික යෙදුම් අතර උසස් අන්තර් සම්බන්ධතාව ඇති කිරීම

JMCvLearning "your virtual learning partner"

සංවිධානයක තොරතුරු පද්ධති වර්ගීකරණය

මෙහෙයුම් කළමනාකරණ මට්ටම

- මෙහෙයුම් කළමනාකරණ මට්ටම මූලික වශයෙන් ව්‍යාපාරයක දෛනික ක්‍රියාකාරකම් නැතහොත් දෛනික ගනුදෙනු පිළිබඳ මූලික අවධානය යොමු කරනු ලබන කළමණාකරන ස්තරයයි
- උදාහරණ ලෙස මුදල් අයකැමි යන්, විකුණුම් නිලධාරීන්, රෝහල් හෙදියන්, බැංකු ටෙලර් කාර්ය මණ්ඩලය ආදිය පෙන්වා දිය හැක
- මෙම ස්තරයේ පරිශීලකයින් විසින් ගනු ලබන තීරණ ව්‍යුහාත්මක තීරණ ලෙස හැඳින්වේ
- ඉන් අදහස් වනුයේ ඔවුන් තීරණය ගැනීමේදි සහ කටයුතු කිරීමේදි පැහැදිලිව හඳුනාගත් රීති රාමුවක් තුළ කටයුතු කළ යුතු බවයි
- උදාහරණයක් ලෙස තොගයකින් භාණ්ඩයක් ණය පහසුකම් මත විකිණීමේදි ණය සඳහා ලබාදෙන ලද ණය සීමාවක් ඇතුළත් ණය ප්‍රතිපත්තිය පවතී

JMC Learning
"your virtual learning partner"

මෙහෙයුම් කළමනාකරණය මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- විවිධ කම්කරුවන් සඳහා වැඩ පැවරීම
- කම්කරුවන් සඳහා දෛනික වැඩ කටයුතු සඳහා උපදෙස් ලබා දීම
- නිෂ්පාදනය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවය පිළිබඳ වගකීම් දැරීම
- සංවිධානය තුළ හොඳ සබඳතාවයක් පවත්වාගෙන යාමේ වගකීම ද ඔවුනට පවරා ඇති
- ඔවුන් සේවක ගැටලු යෝජනා සහ නිර්දේශිත අභියාචනා ආදිය ඉහළ කළමනාකරණ ස්තරයන්ට සන්නිවේදනය කරන අතර ඉහළ ස්තරයන්හි අරමුණු කම්කරුවන් වෙත සන්නිවේදනය කරයි
- ඔවුන් සේවක දුක්ගැනවිලි විසඳීම සඳහා උපකාර වෙයි.

මෙහෙයුම් කළමනාකරණය මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- පහළ නිලධාරීන් අධීක්ෂණය කිරීම සහ මගපෙන්වීම ඔවුන් සිදු කරනු ලබයි.
- කම්කරුවන් සඳහා පුහුණු කිරීම් සිදු කිරීම ඔවුන්ගේ වගකීමකි.
- වැඩකටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය සහ උපකරණ ඔවුන් විසින් සංවිධානය කර දෙනු ලබයි.
- සේවක කාර්ය සාධනය පිළිබඳ කාලීන වාර්තා සකස් කිරීම ඔවුන්ගේ වගකීමකි.
- ඔවුන් ආයතනයේ විනය පිළිබඳ සහතික වෙයි.
- ඔවුන් කම්කරුවන් අභිප්‍රේරණය කරනු ලබයි.

JMC vLearning
your virtual learning partner

ඉහත කාර්යන් සිදු කරමින් ඔවුන් පහත ප්‍රතිඵල පිළිබඳ තහවුරු කිරීම කරයි

සේවක මණ්ඩලයේ සහ මධ්‍ය කළමනාකරණය අතර සම්බන්ධතාවයක් ඇති කරයි

- ඔවුන් මාධ්‍ය කළමනාකරණය සිට සේවකයන් වෙත අදාළ කරුණු සන්නිවේදනය කරන අතර සේවකයින්ගේ සිට යෝජනා චෝදනා දුක්ගැනවිලි ආදිය මධ්‍ය කළමනාකරණයට ද සන්නිවේදනය කරනුලබයි.

ගුණාත්මක භාවය පවත්වා ගෙන යාම

- ආයතනයෙන් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය නඩත්තු කිරීම මොවුන්ගෙන් වගකීමකි.

කාර්ය මණ්ඩලය සඳහා උපදෙස් සැපයීම

- නාස්තිය අවම කිරීමත් ඵලදායිතාවය වැඩි දියුණු කිරීමත් සඳහා සේවකයාට අවශ්‍ය මඟ පෙන්වීම සහ උපදෙස් ලබාදෙයි.

ඉහත කාර්යන් සිදු කරමින් ඔවුන් පහත ප්‍රතිඵල පිළිබඳ තහවුරු කිරීම කරයි

අධීක්ෂක යෙකු ලෙස කටයුතු කිරීම

- සේවකයන් අධීක්ෂණය කරමින් කටයුතු කරවා ගනී

විනය

- සේවක මණ්ඩලය අතර විනය පවත්වාගෙන යයි

ආරක්ෂාව

- ප්‍රමාණවත් ආරක්ෂක පියවරයන් අනුගමනය කරනු ලබයි

පුහුණුව

- පහළ මට්ටමේ සේවකයින් හා අවශ්‍ය ක්‍රම ලබන පුහුණුවීම් පහසුකම් සංවිධානය කරනු ලබයි.

JMC Learning "your virtual learning partner"

මෙහෙයුම් සැලසුම්කරණය

- ➤මෙහෙයුම් සැලසුම් මගින් ආයතනයක් කෙටිකාලීනව සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු සඳහා අවශ්‍ය මෙහෙයුම් සැලසුම් කරනු ලබයි. (බොහෝවිට වර්ෂයක් වැනි කාලයක් තුළ

මෙහෙයුම් සැලසුමක් භාවිතා කිරීමේ පදනම මගින්

- ➤ කාර්යයන් නියමිත කාලයට නිමවීම
- ➤සම්බන්ධීකරණය සහ සන්නිවේදනය
- ➤අවශ්‍ය කරන තාක්ෂණික මිනුම් සපයමින් අරමුණු සාක්ෂාත් කර ගනී.

මෙහෙයුම් සැලසුමක් මගින් පහත සඳහන් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයනු ලබයි

- ➤ අප දැන් සිටින ස්ථානය කුමක්ද?
- ➤ අප සිටිය යුතු ස්ථානය කුමක්ද?
- ➤ අප එම ස්ථානයට ළඟා වන්නේ කෙසේද?
- ➤ අපගේ ප්‍රගතිය මිනුම් කරුණු ලබන්නේ කෙසේද?

මෙහෙයුම් අවදානම්

- ➤මෙහෙයුම් අවදානම් මිනිසුන්, පද්ධතීන් සහ සැකසුමකින් ඇතිවන අතර
- ➤මෙහෙයුම් අවදානම් මානව අතපසුවීම් නිසා සිදුවන සුළු හානි වල සිට විශාල සොරකම් නිසා ඇතිවන බංකොලොත් වීම් තත්ත්ව දක්වා පුළුල් පරාසයක පවතී.
- ➤ඒ සඳහා සොරකම්, නෛතික අවදානම්කාරී තත්ත්වයන්, භෞතික හෝ පාරිසරික අවදානම්කාරී තත්ත්වයන් දීර්ඝ කාන්දුවීම්, ගංවතුර, විදුලි බිඳවැටීම, පරිසර දූෂණය, රසායනික ක්‍රියාකාරකම් හෝ නායයාම්, සුළි සුළං ආදිය පෙන්වා දිය හැක

මෙම මෙහෙයුම් අවදානම් ව්‍යාපාරයේ සෑම ස්ථරයක පැන නැගිය හැක

JMC vLearning
"your virtual learning partner"

මෙම අවදානම්කාරී තත්ත්වයන් ව්‍යාපාරික මෙහෙයුම් වල පහත සඳහන් අංශ නිසා ඇතිවිය හැක

- ව්‍යාපාරික බාධා කිරීම
- සේවකයින්ගේ දෝෂ හෝ මගහැරීම්
- නිෂ්පාදන දෝෂ
- සෞඛ්‍යය හා ආරක්ෂණ ගැටළු
- ආයතනයේ තොරතුරු තාක්ෂණික අංශයේ දෝෂ
- සොරකම්
- ප්‍රධාන පුද්ගලයින්ගේ අහිමිවීම
- නෛතික තත්වයන් නිසා
- සැපයුම්කරුවන් අහිමිවීම

මෙහෙයුම් අවදානම් සාමාන්‍යයෙන් අභ්‍යන්තර පාලනය සහ තාක්ෂණය වැනි අවදානම තක්සේරු කිරීම සහ අවදානම් කළමනාකරණය ආදී භාවිතාවන්ගේ පාලනය යටතේ පවතී.

උපායශීලී කළමනාකරණ මට්ටම



- මෙම ස්ථරය තුළ ආයතනයේ මධ්‍ය කළමනාකරණය, අංශ ප්‍රධානීන් සුපරීක්ෂකයන්, සමන්විත වේ
- මෙම මට්ටමේ කළමනාකරුවන් සාමාන්‍යයෙන් කළමනාකරණය කරනුයේ මෙහෙයුම් මට්ටමේ කළමනාකරුවන්ගේ කටයුතුය ඔළුන් විසින් අර්ධ ව්‍යුහගත තීරන ගනු ලබයි

JMC vLearning "your virtual learning partner"

උපායශීලී කළමනාකරණ මට්ටම

- උදාහරණ ලෙස උපායශීලී කළමනාකරුවන් පාරිභෝගිකයන්ගේ ණය සීමාව සහ එහි ඉතිහාසය සලකා බලන අතර සමහර පාරිභෝගිකයන් සඳහා ණය සීමාවන් ඉහල දැමීම වැනි තීරණ ගනු ලබයි
- කළමනාකරුවා පවත්නා තොරතුරු මගින් පාරිභෝගිකයාගේ ගෙවීම් ඉතිහාසය සහ ණය සීමාවන් හඳුනා ගන්නා අතර ආයතනයට ලැබෙන ප්‍රතිලාභ යම් සලකා බලමින් ණය සීමාවන් ඉහල දැමීමේ තීරණ ගනු ලබයි.

එම තීරණ අර්ධ වශයෙන් ව්‍යුහගත වේ



උපායශීලී කළමනාකරණ කාර්යයන් පහත පරිදි පෙන්වා දිය හැක



- ඉහළ කළමනාකරණයේ මගපෙන්වීම් සහ ප්‍රතිපත්ති වලට අනුකූලව ඔවුන් ආයතනය සැලසුම් ක්‍රියාත්මක කරයි
- ඔවුන් ආයතනයේ උප ඒකක සඳහා සැලසුම් සකස් කරනු ලබයි
- පහළ මට්ටමේ කළමනාකරුවන් සඳහා පුහුණු කිරීම් සිදු කිරීම ආදිය සඳහා ඔවුන් සහභාගි වේ.
- ඔවුන් ඉහළ කළමනාකරණයේ ප්‍රතිපත්ති පහල කළමනාකරණයට අර්ථ නිරූපනය කර පැහැදිලි කරනු ලබයි



JMC vLearning "your virtual learning partner"

උපායශීලී කළමනාකරණ කාර්යයන් පහත පරිදි පෙන්වා දිය හැක

➢ දෙපාර්තමේන්තුව සහ අංශවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ වගකීම මෙම කළමනාකරණ ස්ථරය සතුවේ.

➢ ඔවුන් ඉතාමත් වැදගත් සහ වාර්තා ඉහළ කළමනාකරණයට සපයනු ලබයි.

➢ ඔවුන් කනිෂ්ඨ කලමනාකරුවන්ගේ කාර්ය සාධනය ඇගයීම් කරනු ලබයි

➢ වඩාත් යහපත් කාර්ය සාධනයක් සඳහා ඔවුන් පහල කළමනාකරණය පොළඹවනු ලබයි.



උපායශීලී සැලසුම්කරණය

➢ උපායශීලී සැලසුම්කරණය, කෙටි කාලීන සැලසුම් වන අතර (කෙටිකාලීන යනු සාමාන්‍යයෙන් වර්ෂයක් වැනි කාලයට අඩු) ඒවා ව්‍යාපාරයේ විවිධ අංශ අරමුණු කරගත් ඒවාය

➢ උපායශීලී සැලසුම් ආයතන සාර්ථකත්වයට පත්වීම සඳහා එම ආයතනයේ විවිධ අංශ මඟින් සිදු කළ යුතු දෑ පෙන්වා දෙයි

➢ බහුල වශයෙන් උපායශීලී සැලසුම් සකස් කෙරෙනුයේ නිෂ්පාදනය, අලෙවිකරන , පුද්ගල කළමනාකරණය , මූල්‍ය වැනි ක්ෂේත්‍රයන් සඳහා



JMC vLearning "your virtual learning partner"

උපායමාර්ගික ස්තරය



- මෙය ආයතනයේ ඉහලම කළමණාකරන ස්තරයයි
- මෙම ස්ථරය කළමනාකරුවන් ව්‍යුහාත්මක නොවන තීරණ ගනු ලබයි
- මෙම ස්තරයට ආයතනය දිගුකාලීන සැලසුම් පිළිබඳ සැලකිලිමත් වනු ලබන අධ්‍යක්ෂක මණ්ඩලය, ඉහළ කළමනාකරුවන්, ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන්, ප්‍රධාන විය දායක නිලධාරීන් ආදිය අයත් වේ

උපායමාර්ගික ස්තරය

මෙම ඉහළ කළමනාකරණය කාර්යභාරය

- ඉහළ කළමනාකරණය සමස්ත ව්‍යාපාරයටම අදාළ අරමුණු සහ ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ලබයි
- දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය පටිපාටි සහ න්‍යාය පත්‍රයන් සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම
- සමස්ත ව්‍යාපාර සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම
- මධ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තු සඳහා කළමනාකරුවන් පත් කිරීම
- සමස්ත ආයතනයෙන්ම දෙපාර්තමේන්තු වල කාර්යභාරයන් සම්බන්ධීකරණය කිරීම සහ පාලනය කිරීම
- බාහිර පාර්ශවයන් සමඟ ඇති සම්බන්ධතාවයන් පවත්වා ගැනීම සඳහා වගකීම් දැරීම
- උපදෙස් සහ මගපෙන්වීම
- ව්‍යාපාරයේ කාර්ය සාධනය කෙරෙහි කොටස්කරුවන්ගේ දායකත්වය සම්බන්ධයෙන් ද වගකීම් දරනු ලබයි.

JMC vLearning
"your virtual learning partner"

උපායමාර්ගික සැලසුම්

මෙම කළමනාකරණය පහත දැක්වෙන ප්‍රශ්න වලින් අවම වශයෙන් එකකට හෝ අවධානය යොමු කරයි.

- ❖අප සිදුකරනුයේ කුමක්ද
- ❖අප එය සිදුකරනුයේ කවුරුන් උදෙසා ද
- ❖ආයතනයක් ලෙස අප විශිෂ්ටත්වයට පත් වන්නේ කෙසේද

- ➢ සාමාන්‍යයෙන් උපායමාර්ග තීරණ වසර කීපයක් දක්වා අනාගතයකට විහිදේ
- ➢ කළමනාකරණයට ඉතාමත් අඩු පාලනයක් සහිත තත්ත්වයන්හි (යුද්ධ හා දේශපාලනික වෙනස්වීම් ආදිය) උපායමාර්ගික සැලසුම් අතරවාරයේ යම් යම් වෙනස්කම් සිදු කරනුයේ අදාළ කාල සීමාවන් සහ අදාල ප්‍රශ්නයේ ස්වරූපය අනුව යි
- ➢ ඉහත සඳහන් කළද අවම පාලනයක් සහිතව තත්ත්වයන් උපායමාර්ගික අවදානම් ලෙස හැඳින්වේ.



පහත වගුවේ දැක්වෙන්නේ තොරතුරු වල ගුණාත්මක භාවයන් සහ විවිධ අවස්ථාවන්ට අදාළව ඒවා වෙනස් වන ස්වරූපයයි

ගුණාංගය	උපායමාර්ගික	මෙහෙයුම්
කාලසීමාව	ප්‍රමාද වීම	ක්ෂණිකව ලබාගතහැකිවීම
ප්‍රමාණාත්මකභාවය	ගුණාත්මකය	ප්‍රමාණාත්මකය
නිවැරදිබව	ආසන්න වශයෙන්නිවැරදි වේ	නිවැරදිවේ
නිශ්චිත බව	අවිනිශ්චිතය	නිශ්චිතය
සම්පූර්ණ බව	අර්ධවශයෙන්	සම්පූර්ණයි
පුළුල් බව	පුළුල්	සුවිශේෂී
සවිස්තරාත්මක බව	සුළු වශයෙන් විස්තරාත්මකය	වඩාත් විස්තරාත්මකයි.

තොරතුරුවල ගතිලක්ෂණ

ගුණාංගය	උපායමාර්ගික	මෙහෙයුම්
කාලසීමාව	තොරතුරු ඓතිහාසික (අතීතයේ සිදුව ඇත්තේ කුමක්ද යන්න පිළිබඳ කළමනාකරණයට අදහසක් ලබාගත හැක) හෝ පුරෝකතනය කළ ඒවා විය හැක.	මෙහෙයුම් තොරතුරු ඓතිහාසික තොරතුරු මත පදනම් වූ සත්‍ය ඒවා විය යුතුය.
කාල නියමය	තීරණ ගැනීම සති හෝ මාස ගණනකින් සිදුවන නිසා තොරතුරු වල කාල නිර්ණය එතරම් තීරක සාධකයක් නොවේ. තරගකරුවන්ගේ ජයග්‍රහණ ආදී සැලකිය යුතු වෙනස්කම් පරිදි ජ්‍යේෂ්ඨ කළමනා කරුවන්හට ක්ෂණිකව ලබා දෙයි	ක්ෂණිකව ලබා ගැනීම සඳහා තොරතුරු පැවතිය යුතුය
නිවැරදිබව	තොරතුරු සම්පූර්ණයෙන්ම නිවැරදි ලෙස පැවැත්වේ අපේක්ෂා කළ නොහැකි වන්නේ ඒවා බොහෝ දුරට ආසන්න 1000ට වටා ඇති බැවිනි.	තොරතුරු අනිවාර්යෙන්ම නිවැරදිව පැවතිය යුතුය. මෙම ස්තරයේ තීරණ ගැනීම සඳහා නිවැරදිම කරුණු පාදක කරගත යුතුය

තොරතුරුවල ගතිලක්ෂණ

ගුණාංගය	උපායමාර්ගික	මෙහෙයුම්
වාස්තවිකතාවය	උපායමාර්ගික තීරණ ගැනීම සඳහා වාස්තවික මෙන්ම විෂයානුබද්ධව වශයෙන් සංකලනය වූ තොරතුරු අවශ්‍ය වේ. දිගුකාලීන සැලසුම් නිර්මාණය කිරීම සඳහා අනාගත තොරතුරු අවශ්‍ය වන අතර ඒ සඳහා විෂයානුබද්ධ පුරෝකතන අවශ්‍ය වේ උදාහරණ අනාගතයේ කුමක් සිදුවන්නේ ද ආදී වශයෙන්.	උපායමාර්ගික තීරණ ගැනීම සඳහා ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක තොරතුරු අවශ්‍ය වේ. උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේදී මෙම දත්ත ගණිතමය ආකෘතීන් සමග සම්බන්ධිතව යොදාගනු ලබයි.
ප්‍රමාණාත්මකභාවය	මෙහෙයුම් මට්ටමේ දී ඉතාමත් ව්‍යුහාත්මක වන අතර වාස්තවික සහ ප්‍රමාණාත්මක තොරතුරු අවශ්‍ය වේ. සංසන්දනාත්මකව පහල මට්ටම් සඳහා තේරුම බොළඳි පැහැදිලි උපදෙස් සපයා තැබීම අවශ්‍ය වේ.	
නිශ්චිත බව	මෙහි ස්වභාවයෙන්ම අනාගත තොරතුරු අවිනිශ්චිතය. අදාළ සිදුවීම් අනුව දත්ත බල ඇති සීමාවන් සඳහා අනුගත වී කටයුතු කිරීම උපාය මාර්ගික සැලසුම් කරුවන් සතුව හැකියාව පැවතිය යුතුය.	තොරතුරු වල නිශ්චිත බව ඉහළින්ම ආරක්ෂා විය යුතු ඉතාමත් සුළු අවිනිශ්චිතතාවයක් පැවතිය යුතුය. ඒවා අදාළ සිද්ධියේ ඓතිහාසික වාර්තා හා සම්බන්ධය. උදාහරණ ලෙස පසුගිය මාස කිහිපයේ විකුණුම් වාර්තා.

JMC vLearning
"your virtual learning partner"

තොරතුරුවල ගතිලක්ෂණ

ගුණාංගය	උපායමාර්ගික	මෙහෙයුම්
සම්පූර්ණ බව	උපායමාර්ගික සැලසුම් කරුවන් තොරතුරු අර්ධ වශයෙන් භාවිතා කරනු ලබයි. ඒ සඳහා ඔවුන් උපකල්පන සහ ඇස්තමේන්තු භාවිතා කරමින් හැකිතරම් සම්පූර්ණ ආකෘතියක් සැකසීමට උත්සාහ දරයි	මෙම මට්ටමේ දී ගනු ලබන තීරණ ඉතාමත් ඉහළින් පුරෝකතනය කළ හැකි ඒවා විය යුතු අතර එමගින් තොරතුරු වඩාත් සුදුසු සහ සුවිශේෂී බවට පත් කරනු ලබයි
පුළුල් බව	උපායමාර්ගික සැලසුම් කිරීම සඳහා පුළුල් පරාසයක දත්ත අවශ්‍ය වේ එය ව්‍යාපාරයේ පවත්නා වූ සියලුම ක්‍රියාකාරකම් ආවරණය කළ යුතුය.	මෙම මට්ටමේදී තොරතුරු මුළුමනින්ම භාවිතා කරනුයේ යම් සුවිශේෂී තීරණයක් ගැනීම සඳහාය අනෙකුත් දත්ත අදාළ නොවන හෝ සලකා නොබලන ඒවාය
සවිස්තරාත්මක බව	උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේදී තොරතුරු විස්තරාත්මක විය යුතු බවට අනිවාර්ය තාවයක් නොමැති අතර වැනි විස්තරාත්මක තොරතුරු ව්‍යාකූල තත්ත්වයට පත්වන හෝ අවධානය වෙනත් අතකට යොමු කරන ආකාරයේ තොරතුරු විය හැක. ඒකාබද්ධ සහ සාරාංශගත කරන ලද දත්ත ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් විසින් පොදුවේ භාවිතා කරනු ලබයි	තනි ඒකක සඳහා තීරණ ගැනීමේදී කළමනාකරු වට වඩාත් විස්තරාත්මක තොරතුරු ලැබිය යුතුය. උදාහරණ ලෙස එක් සැපයුම්කරුවකු ගෙන් ඇනවුම් කළයුතු මුළු ඒකක ප්‍රමාණය

විවිධ කළමණාකරන ස්තරවල තොරතුරු පද්ධති

- සිය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ආයතන මගින් විවිධ වර්ගයේ තොරතුරු පද්ධති භාවිතා කරනු ලබයි
- මෙලෙස ආයතන මගින් භාවිත කරනු ලබන තොරතුරු පද්ධති

කාර්යාල ස්වයංක්‍රියකරණ පද්ධති	ගනුදෙනු සැකසුම් පද්ධති	කළමනාකරණ තොරතුරු පද්ධති	**තීරණ** ආධාරක පද්ධති
	විධායක තොරතුරු පද්ධති	ව්‍යාපාරික නිපුණ පද්ධති	

- මෙම තොරතුරු පද්ධති වලට අමතරව ව්‍යාපාරය සුවිශේෂී තොරතුරු පද්ධති භාවිතා කරණ අතර

ව්‍යාපාරික සම්පත් සැලසුම්කරණ පද්ධති	පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධති	සැපයුම් දාම කළමනාකරණය

කාර්යාල ස්වයංක්‍රීයකරණ පද්ධති

Office Automation Systems (OAS)

JMC vLearning
"your virtual learning partner"

කාර්යාල ස්වයංක්‍රියකරණ පද්ධති Office Automation Systems (OAS)

- මෙම වර්ගයේ තොරතුරු පද්ධති කාර්යාලයේ කටයුතු ස්වයංක්‍රියකරණය කිරීම සඳහා උපකාර වෙයි
- ඒවායේ තීරණ ගැනීම ආදිය සඳහා සීමිත හැකියාවක් පවතින අතර මෙහෙයුම් මට්ටමේ කටයුතු කිරීම සඳහා වැඩි වශයෙන් ප්‍රයෝජනවත් වෙයි
- මෙම තොරතුරු පද්ධති කාර්යාලය පරිසරය ස්වයංක්‍රීය කරනවා මෙන්ම කඩදාසි රහිත කාර්යාල පරිසරයක් ගොඩනැගීම සඳහා ද උපකාරී වේ
- ඉතාමත් සරල ක්‍රියාවලින් පවා ස්වයංක්‍රියකරණය ට ලක් කරමින් කාර්යාලීය ස්වයංක්‍රිය කරන පද්ධති මගින් කාර්යාලයේ කාර්යමණ්ඩලයේ ඵලදායිතාවය වැඩිකිරීම සඳහා උපකාරී වේ
- කාර්යාල ස්වයංක්‍රියකරණය පද්ධති සඳහා උදාහරණ ලෙස Ms office සමග ඇති මෘදුකාංග යෙදුම් පෙන්වා දිය හැක

කාර්යාල ස්වයංක්‍රියකරණ පද්ධති Office Automation Systems (OAS)

වාසි

- පුනරාවර්තන සහ සුපුරුදු කාර්යන් සිදු කිරීම සඳහා වන හස්ත මැදිහත්වීම් නැතහොත් මානව මැදිහත්වීම් අවම කිරීම
- සැකසුම් කාලය අවම කිරීම
- අතින් සිදුවන දෝෂ අවම කිරීම
- තොරතුරු පාදක කර ගනිමින් වඩාත් හොඳ ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා ඉඩකඩ සැලසීම
- කාර්යාලීය ක්‍රියාකාරකම් වඩාත් ඉක්මන් වීම සහ ඒවා ක්‍රියාවලිය මගින් බලගැන්වෙන ඒවා වීම.
- දත්ත ඩිජිටල්කරණය කිරිම සහ අනාගත පරිශීලනය සඳහා ඒවා කාර්යක්ෂමව ගබඩා කොට තැබීම.

JMC vLearning
your virtual learning partner

ගනුදෙනු සැකසුම් පද්ධති

Transaction Processing System (TPS)

ගනුදෙනු සැකසුම් පද්ධති Transaction Processing System (TPS)

- ගනුදෙනු සැකසුම් පද්ධති මගින් ව්‍යාපාරය සෑම මෙහෙයුමක් හරහාම සිදුවන ගනුදෙනු වෙලා ජනිත වුන දත්ත දර්ශනය කිරීම එක්රැස් කිරීම ගබඩා කිරීම සහ සකස් කිරීම සිදු කරනු ලබයි
- ගනුදෙනු සැකසුම් පද්ධතියක මූලික පරමාර්ථය වනුයේ ව්‍යාපාරයක් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරය කළමනාකරණය සහ ප්‍රතිපත්තීන් මගින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු සපයා දීමයි

ගනුදෙනු සැකසුම් පද්ධතියක පහත සඳහන් ලක්ෂණ හඳුනා ගත හැක

- විශාල දත්ත ප්‍රමාණයක් සකස් කරනු ලබයි.
- බොහෝ දත්ත අභ්‍යන්තරිකව එක්රැස් කරනු ලබයි.
- දත්ත ආදාන හා ප්‍රතිදාන වඩාත් ව්‍යුහගත ය.
- ඉතාමත් අඩු ගණනය කිරීම් සංකීර්ණතාවය
- ඉතාමත් ඉහළ නිවැරදි තාවයක් සහ දත්ත ඒකාග්‍රතාවයක් අවශ්‍ය වීම.

ගනුදෙනු සැකසුම් පද්ධති සඳහා උදාහරණ

- විද්‍යුත් විකුණුම් ස්ථාන පද්ධති - දෛනික විකුණුම් වාර්තා කරයි
- වැටුප් සැකසුම් පද්ධති - සේවකයින්ගේ වැටුප් සැකසීම සහ ණය කළමනාකරණය සිදු කරයි.
- තොග පාලන පද්ධති - තොග මට්ටම් පිළිබඳ තොරතුරු නඩත්තු කරයි.
- ගුවන් ගමන් වෙන් කිරීමේ පද්ධති - ගුවන් යානා ආසන වෙන් කිරීම කළමනාකරණය කරයි

කාර්යක්ෂේත්‍රය	ගණුදෙනු සැකසුම් පද්ධති
ගිණුම්කරණ සහ මූල්‍ය	• ගිණුම් තොරතුරු පද්ධති • මූල්‍ය කොරතුරු පද්ධති
අලෙවිකරණ සහ විකුණුම්	• විකුණුම් ස්ථාන පද්ධති • විකුණුම් ඇණවුම් තොරතුරු පද්ධති
නිෂ්පාදන හා මෙහෙයුම්	• තොග පාලන පද්ධති • තත්ව පාලන පද්ධති • යන්ත්‍ර පාලන පද්ධති
මානව සම්පත් කළමණාකරණ	• මානව සම්පත් තොරතුරු පද්ධති • වැටුප් සැකසුම් පද්ධති • කාර්‍ය මණ්ඩල ඇගයීම් පද්ධති

ගනුදෙනු සැකසුම් පද්ධති වල තොරතුරු ප්‍රවාහයන්

- අදාළ සිද්ධිය දත්ත ආදාන උපකරණ මගින් වාර්තා කරනු ලබයි
- ගනුදෙනු සැකසුම් පද්ධතිය මගින් දත්ත පදනම යාවත්කාලීන කරයි
- ගනුදෙනු සැකසුම් පද්ධතිය මගින් සාමාන්‍ය වාර්තා ජනනය කරයි
- පරිශීලකයන් වෙත ගණුදෙනු සැකසුම් පද්ධතිය විමසුම් ඉදිරිපත් කළ හැක.



JMC vLearning
your virtual learning partner

ගනුදෙනු සැකසුම් පද්ධති වර්ග

- තනිව පවතින පද්ධති
- ව්‍යවසාය සේවා සැපයුම් සේවා දායක පද්ධති
- වෙබ් පාදක පද්ධති

තනිව පවතින පද්ධති

- තනිවූ පවතින පද්ධතියක් මානයයෙන් තනි පරිශීලක පද්ධතියකි
- මෙවැනි වර්ගයේ පද්ධති සාමාන්‍යයෙන් කුඩා කාර්යාල පරිසරයක ක්‍රියාත්මක වන අතර ගනුදෙනු සැකසුම් පද්ධති යත් දත්ත පදනමක් පුද්ගල පරිගණකයක ගබඩා කොට තබයි



ව්‍යවසාය සේවා සැපයුම් සේවා දායක පද්ධති

- ව්‍යවසාය සේවා සැපයුම් සේවා දායක පද්ධති ව්‍යාපාරය පුරා ඇති සේවා සැපයුම් සහ සේවාදායක පරිගණක පරිගණක ජාලය හරහා එකිනෙකට සම්බන්ධ කොට ඇති පරිසරයක් තුළ ක්‍රියාත්මක වේ
- මෙවැනි වර්ගයේ පද්ධති මගින් අපේක්ෂා කරනු ලබන දත්ත ගබඩා කොට ඇත්තේ කේන්ද්‍රියව පිහිටුවා ඇති සේවා සැපයුම් පරිගණක තුළයි
- ගනුදෙනු සැකසුම් පද්ධති සේවාදායක මෘදුකාංගය පිහිටුවා ඇත්තේ පුද්ගල පරිඝනකයක වන අතර එමගින් කේන්ද්‍රිය ගබඩා කොට ඇති දත්ත ප්‍රවේශ වීමේ හැකියාවක් සකසා ඇත



ගනුදෙනු සැකසුම් පද්ධති වර්ග

- තනිව පවතින පද්ධති
- ව්‍යවසාය සේවා සැපයුම් සේවා දායක පද්ධති
- වෙබ් පාදක පද්ධති

JMC vLearning
"your virtual learning partner"

වෙබ් පාදක පද්ධති

- වෙබ් පාදක ගනුදෙනු සැකසුම් පද්ධති පරිශීලකයාගේ පුද්ගල පරිගණකයේ ස්ථාපනය කරනු නොලබයි
- ඒ වෙනුවට ගණුදෙනු සැකසුම් පද්ධතියට ප්‍රවේශ වීම සඳහා පරිශීලකයා වෙබ් පිරික්සුම් භාවිතා කරමින් අදාළ වෙබ් ලිපිනයක් ඇතුළත් කරමින් ගණුදෙනු සැකසුම් පද්ධතියට ප්‍රවේශ විය යුතුය
- මෙම පද්ධති වල ඉහල පරිශීලකයින් ප්‍රමාණයක් සිටි



ගනුදෙනු සැකසුම් පද්ධති වර්ග

- තනිව පවතින පද්ධති
- ව්‍යවසාය සේවා සැපයුම් සේවා දායක පද්ධති
- වෙබ් පාදක පද්ධති

කාණ්ඩ හෝ මාර්ගගත සැකසීම (Batch or Online Processing)

ගනුදෙනු සැකසුම් පද්ධතියක් ප්‍රධාන ආකාර දෙකක සැකසුම් ක්‍රම භාවිත කරයි.

- කණ්ඩ සැකසීම
- මාර්ගගත සැකසීම



කණ්ඩ සැකසීම

- කණ්ඩායම් සැකසීමේදී, ගනුදෙනු වලින් දත්ත එක්රැස් කර කාණ්ඩගත කරනු ලැබේ
- පද්ධතිය වරින් වර දත්ත සමූහය (කණ්ඩායම් ලෙස හැඳින්වේ) ක්‍රියාවට නංවයි
- උදාහරණයක් ලෙස සෑම පැයකටම

මාර්ගගත සැකසීම

- දත්ත කාණ්ඩ කිරීමකින් තොරව සකස් කරයි

JMC Learning "your virtual learning partner"

කළමනාකරණ තොරතුරු පද්ධති
Management Information System (MIS)

කළමනාකරණ තොරතුරු පද්ධති

- ව්‍යාපාරයේ වර්තමාන කාර්ය සාධන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා මධ්‍ය කළමනාකරණයේ උපායශීලී කළමනාකරුවන් විසින් කළමනාකරණ තොරතුරු පද්ධති භාවිතා කරනු ලබයි
- ගනුදෙනු සැකසුම් පද්ධති ආදානය ලෙස භාවිතා කරනු ලබයි
- දත්ත එක්රැස් කිරීම දත්ත සකස් කොට තොරතුරු නිර්මාණය කිරීම පසු භාවිතය සඳහා තොරතුරු වර්ගීකරණය සාරාංශගත කිරීම සහ වාර්තා උත්පාදනය සඳහා තොරතුරු බෙදාහැරීම ආදිය එලෙස සිදු කරනු ලබයි



කළමනාකරණ තොරතුරු පද්ධති

- මෙම තොරතුරු මාධ්‍ය කළමනාකරණය මගින් භාවිතා කරනු ලබන අතර ඒ හරහා කාර්ය සාධනයන් පරීක්ෂාකිරීම නියාමනය කිරීම සහ පුරෝකතනය කිරීම සිදු කරනු ලබයි
- උදාහරණයක් ලෙස විද්‍යුත් ස්ථාන පද්ධතියේහොඳින් ක්‍රියාත්මක වන නිෂ්පාදන සහ එලෙස ක්‍රියාත්මක නොවන නිෂ්පාදන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැක

කළමණාකරණ තොරතුරු පද්ධති සඳහා උදාහරණ ලෙස

- විකුණුම් කලමනාකරණ පද්ධති - මේවා විකුණුම ස්ථාන පද්ධතිවලින් ආදාන ලබාගනී
- අයවැය පද්ධති - ආයතනයක් මගින් සිය කෙටි කාලීන සහ දිගු කාලීනව ක්‍රියාවලීන් සඳහා කොපමණ මුදලක් වැය කොට තිබේ ද යන්න පෙන්වා දෙයි
- මානව සම්පත් කලමනාකරණ පද්ධති - සේවකයින්ගේ සමස්ත අර්ථ සාධනය කළමනාකරණය කරනු ලැබේ.

කළමනාකරණ තොරතුරු පද්ධති

- උපායශීලී කළමනාකරුවන් අර්ධ ව්‍යුහගත තීරණ ගැනීම සඳහා වගකීම් දරයි
- කළමනාකරණ තොරතුරු පද්ධතියක් මගින් ව්‍යුහගත තීරන ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ද උත්පාදනය කරයි
- කළමනාකරුවාගේ පළපුරුද්ද අනුව ඔවුන් මෙම ගනු ලබයි
- දෙවන කාර්තුව සඳහා කොපමණ මිලදී ගැනීම් කළ යුතුද යන්න සලකා බැලීම

JMC VLearning
your virtual learning partner

කළමනාකරණ තොරතුරු පද්ධති වර්ග

➢ කළමනාකරණ තොරතුරු පද්ධතිය යනු ඉතාමත් පුළුල් සංකල්පයක් එහි ප්‍රධාන වර්ගය තව තොරතුරු පද්ධතිය කීපයක් අඩංගුව ඇත

කළමනාකරණ තොරතුරු පද්ධති වර්ග

- අලෙවිකරණ තොරතුරු පද්ධති
- ව්‍යාපාර බුද්ධි පද්ධති
- පාරිභෝගික සබඳතා කලමනාකරණ පද්ධති
- විකුණුම් බලකා ස්වයංක්‍රියකරණ පද්ධති
- දැනුම් කලමනාකරණ පද්ධති
- මූල්‍ය ගිණුම්කරණ පද්ධති
- මානව සම්පත් කළමනාකරණ පද්ධති
- සැපයුම්දාම කළමනාකරණ පද්ධති

JMC vLearning
"your virtual learning partner"

අලෙවිකරණ තොරතුරු පද්ධති

කළමනාකරණ තොරතුරු පද්ධති වර්ග

➢ අලෙවිකරණ නිලධාරීන් මෙම පද්ධතිය භාවිතා කරමින් වර්තමාන සහ අතීත අලෙවි කරනා ව්‍යාපෘතීන් වල සාර්ථක අසාර්ථක බව අධ්‍යයනය කොට ඒ අනුව ඉදිරි අලෙවිකරණ සැලසුම් සැලසුම් කිරීමක් සිදුකරනු ලබයි.

ව්‍යාපාර බුද්ධි පද්ධති

➢ එක්රැස් කරන ලද තොරතුරු විශ්ලේෂණය කරමින් ඒකාබද්ධ කරමින් ඒකරාශී කරමින් ඒ මත පදනම්ව තීරණ ගැනීම සඳහා මෙම ව්‍යාපාර බුද්ධි පද්ධති භාවිතා කරනු ලබයි. මෙය විධායක තොරතුරු පද්ධති වලට සමාන වුවත් පහළ මට්ටමේ කළමනාකරුවන් විසින් ද භාවිතා කරනු ලබයි



පාරිභෝගික සබඳතා කලමනාකරණ පද්ධති.

කළමනාකරණ තොරතුරු පද්ධති වර්ග

- පාරිභෝගික සබඳතා පද්ධතියක් මගින් පාරිභෝගිකයන්ට අදාළ වැදගත් තොරතුරු ගබඩා කරනු ලබයි
- ඒ අතර පෙර විකුණුම් සබඳතා තොරතුරු සහ විකුණුම් අවස්ථාවන් අන්තර්ගත වේ
- අලෙවිකරණ පාරිභෝගික සේවා සහ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් මෙම පද්ධති බහුලව භාවිතා කරනු ලබයි

විකුණුම් බලකා ස්වයංක්‍රීයකරණ පද්ධති

- විකුණුම් ක්‍රියාවලිය සඳහා අදාළ යම් යම් කාර්යයන් ස්වයංක්‍රීයකරනය කිරීම පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධතියක සුවිශේෂී අංගයකි එහි සබඳතා කළමනාකරණය ඇනවුම් කළමනාකරණය ආදී අංග ඇතුළත් වී තිබිය හැක.

දැනුම් කලමනාකරණ පද්ධති Knowledge Management System

- දැනුම් කළමනාකරණ පද්ධතියක් යනු තොරතුරු නිර්මාණය කිරීම ග්‍රහණය කිරීම ගබඩා කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා අදාල දැනුම කළමනාකරණය කරනු ලබන පද්ධති විශේෂයක
- KMS යනු සේවකයින්ට සංවිධානයේ තොරතුරු හා විසඳුම් වෙත ප්‍රවේශය ලබා ගැනීමයි.

මූල්‍ය ගිණුම්කරණ පද්ධති

කළමනාකරණ තොරතුරු පද්ධති වර්ග

- කළමනාකරණ තොරතුරු පද්ධතියක මෙම සුවිශේෂී පහසු ක්‍රම මගින් ආයතනයෙන් මූල්‍ය සහ ගිණුම්කරණ කටයුතු හසුරුවනු ලබයි
- උදා ලෙස ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.

මානව සම්පත් කළමනාකරණ පද්ධති

- මෙම තොරතුරු පද්ධති මගින් සේවකයන්ගේ කාර්ය සාධනය සහ වැටුප් සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යනු ලබයි.

සැපයුම්දාම කළමනාකරණ පද්ධති

- මෙම පද්ධතිය නිෂ්පාදන සමාගම් විසින් සම්පත් අමුද්‍රව්‍ය සහ සේවාවන් මිලදී ගැනීමේ සිට වෙළෙඳපොළ දක්වා වූ ප්‍රවාහයන් පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා භාවිතා කෙරේ.

කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා වර්ග

ආයතනයේ වර්තමාන කාර්ය සාධනය සහ ඓතිහාසික වාර්තා පදනම් කරගනිමින් ප්‍රධාන වර්ග තුනක වාර්තා මෙම පද්ධති මගින් උත්පාදනය කරයි

කාලීන වාර්තා

- සුපුරුදු පරිදි යම් කාල පරාසයන් තුළ නිර්මාණය කරනු ලබන වාර්තා
- යම්කිසි නිශ්චිත කාල පරාසයන් තුළ ව්‍යාපාරයේ කාර්ය සාධනය විශ්ලේෂණය කළ හැක
- උදාහරණ ලෙස දෛනික විකුණුම් වාර්තා සතිපතා සේවක පැමිණීම වාර්තා

සුවිශේෂී වාර්තා

- මෙම වර්ගයේ කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා යම්කිසි ගැටළුවක් උද්ගත වූ පසුව ඔයා යම් සුවිශේෂී අවස්ථාවක උත්පාදනය කරනු ලබයි
- උදාහරණ ලෙස කළමනාකරුවකුට පාරිභෝගිකයෙකු හට ණය පහසුකමක් අනුමත කිරීමට අවශ්‍ය නම් එම අවස්ථාවේ ඔහුට පාරිභෝගිකයාගේ ගිණුම් වාර්තාවක් ලබාගත හැක

ව්‍යතිරේක වාර්තා

- උදාහරණ ලෙස ණය සීමාව ඉක්ම ගිය පසු මෙම වාර්තා උත්පාදනය කරනු ලබයි
- එසේම නිෂ්පාදන අංශය මගින් හානි වූ නිෂ්පාදනයන් සම්මත හානි මට්ටම අභිබවා නිෂ්පාදනය කරයි මෙවැනි වාර්තා උත්පාදනය කරනු ලබයි

JMC vLearning "your virtual learning partner"

තීරණ ආධාරක පද්ධති
Decision Support System (DSS)

JMC vLearning
your virtual learning partner

<u>තීරණ ආධාරක පද්ධති</u>

- තේරුම ආධාරක පද්ධතියක් යනු ආයතනයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය වන සුවිශේෂී පරිගණකගත තොරතුරු පද්ධතියකි
- තීරණ ආධාරක පද්ධති මගෙන් සාරාංශගත තොරතුරු ව්‍යතිරේකයන් රටාවන් සහ ප්‍රවණතාවයන් විශ්ලේෂණාත්මක ආකෘතියේ සමගින් භාවිතා කරයි
- තේරුණා ආධාරක පද්ධතියක් තීරණ ගැනීම සඳහා උපකාරී වනවා මිස අනිවාර්යෙන් ගතයුතු තීරණ දෙනු නොලබයි
- ආයතනයක ඉහළ කළමනාකරණය මගින් මෙම තීරණ ආධාරක පද්ධතිය සුවිශේෂී තීරණ ගැනීම සඳහා භාවිතා කරයි
- තීරණ ආධාරක පද්ධතියක් ආදානයන් ලබාගන්නා ආයතනය අභ්‍යන්තර මූලාශ්‍ර වලින් සහ සමහර බාහිර තොරතුරු පද්ධති මගිනි

- තීරණ ආධාරක පද්ධතියක මූලික අරමුණ වනුයේ සුවිශේෂී සහ ක්ෂණිකව වෙනස් වන ස්වභාවය තත්ත්වයන් සඳහා විසඳුම් සැපයීමයි.

තීරණ ආධාරක පද්ධති

තීරණ ආධාරක පද්ධතියක් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයයි.

- ➢ නිෂ්පාදන දෙගුණ කරන්නේ නම් සේවකයන්ගේ කාර්ය සාධනය කුමක් විය යුතුද?
- ➢ නව තරගකරුවෙක් වෙළඳපළට ප්‍රවේශ වුවහොත් විකුණුම සඳහා කුමක් වේද?

තීරණ ආධාරක පද්ධතියක් විසඳුම් ලබා දීමේදී අන්තර් ක්‍රියාකාරී නවීන ගණිතමය සහ සංඛ්‍යාන විද්‍යාත්මක ආකෘතීන් තාක්ෂණික ක්‍රමයන් භාවිතා කරනු ලබයි

තීරණ ආධාරක පද්ධතියක් පහත සඳහන් පද්ධතිවලින් සමන්විතය

- ➢ මූල්‍ය සැලසුම් කරන පද්ධති
- ➢ බැංකු ණය කළමනාකරණ පද්ධතිය

තීරණ ආධාරක පද්ධතියක් පහත සඳහන් පද්ධතිවලින් සමන්විතය

මූල්‍ය සැලසුම් කරන පද්ධති

- ➢ මෙමගින් සපුරා නො ලබන ඉලක්ක ඇගයීමේ විකල්ප ක්‍රමවේදයන් ඉදිරිපත් කරයි
- ➢ මූල්‍ය සැලසුම් කරන පද්ධතියක් යමක් වුවහොත් විශ්ලේෂණය වැනි දෑ යොදා ගනිමින් විකුණුම් සහ පිරිවැය දත්ත වෙනස් කරමින් තීරණය ශුද්ධ ලාභය කෙරේ කෙසේ බලපෑම් කරන්නේද යන්න පිළිබඳ අවබෝධ කර ගැනීමේ විකල්ප මාර්ග සලසයි.

බැංකු ණය කළමනාකරණ පද්ධතිය

- ➢ මේ මගින් ණය අයදුම්කරු විසින් අයදුම් කරන ණය ප්‍රමාණයක් පාරිභෝගිකයාට නැවත ගෙවීම සඳහා ඇති හැකියාවක් සත්‍යාපනය කරනු ලබයි.

JMC vLearning
"your virtual learning partner"

වැඩසටහන්ගත වූ සහ වැඩසටහන්ගත නොවූ තීරණ

වැඩසටහන්ගත වූ සහ වැඩසටහන්ගත නොවූ තීරණ ලෙස ප්‍රධාන වර්ග දෙකක තීරණ පවතී

වැඩසටහන් ගත තීරණ සාමාන්‍ය කටයුතුවල ස්වයංක්‍රීය ක්‍රියාවලියක් මගින් තීරණය කරනු ලබයි. ඒවා

- එම ආකාරයේ තීරණ අතීතයේ කිහිප වතාවක් ගෙන තිබීම
- තීරණ ගැනීම සඳහා හඳුනාගත් උපදෙස් මාලාවක් හා රීති මාලාවක් පැවතීම

වැඩසටහන් ගත නොවූ තීරණ ගැනීම සුවිශේෂී සහ අසාමාන්‍ය අවස්ථාවන්වල සිදු කරනු ලබයි. ඒවා

- බොහෝවිට අලුත්ම තීරණ වේ
- එහි අනුගමනය කිරීම සඳහා රීති හෝ උපදෙස් නොමැතිවීම
- මෙවැනි තීරණ බොහෝ විට පවත්නා තොරතුරු මත පමණක් පදනම් වෙයි
- මෙවැනි තීරණ මුළුමනින්ම තීරණ ගනු ලබන පුද්ගලයාගේ කැමැත්ත දැනුම පළපුරුද්ද සහ විනිශ්චය මත පදනම් වේ

සාමාන්‍යයෙන් තීරණ ආධාරක පද්ධතිය වල ඇත්තේ වැඩසටහන් ගත නොකළ තීරණයන්ය.

තීරණ ආධාරක පද්ධතියක ගුණාංග

- විවිධ තත්වයන් අනුව නම්‍යශීලී වීමට සහ අනුගත වීමට ඇති හැකියාව
- ඉහළ අන්තර් ක්‍රියාකාරීත්වය
- භාවිතයේ පහසුව
- ඉහල කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය
- සමස්ථ පාලනය තීරණ ගනු ලබන්නන් අත පැවතීම
- විස්තීරණ තාවය
- ආකෘතිකරණය සහ විශ්ලේෂණය සඳහා ඇති පහසුව.
- වඩාත් ඉහළ දත්ත ප්‍රවේශය
- තනිව පවතින ඒකාබද්ධ හෝ වෙබ් පාදක වශයෙන් ඕනෑම ආකාරයක පැවතීම

MCVLearning your virtual learning partner

තීරණ ආධාරක පද්ධතියක විශේෂාංග

- තීරකයින් සඳහා අර්ධ ව්‍යුහගත හෝ ව්‍යුහගත නොවූ තීරණ ගැනීම සඳහා උපකාර වීම
- පුළුල් පරාසයක කළමනාකරුවන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම මෙම පරාසය විධායක කළමනාකරණය සිට ඉතාමත් පහළ මට්ටමේ රේඛීය කළමනාකරණය දක්වා විහිදේ.
- පුද්ගලයින්ට මෙන්ම කණ්ඩායම්වලට උපකාර සැපයීම.ඉතාමත් සුළු වශයෙන් ව්‍යුහගත ප්‍රශ්න සඳහා විවිධ දෙපාර්තමේන්තුවල පුද්ගලයින් කීප දෙනෙකුගේ දායකත්වය අවශ්‍ය වේ.
- ස්වාධීන හා අනුක්‍රමික තීරණ සඳහා උපකාර වීම
- බුද්ධිමය සැලසුම් කිරීම් තෝරාගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබාදීම
- විවිධ වර්ගයේ තීරණ ගැනීමේ ක්‍රියාදාමයන් සහ ක්‍රම හා උපකාරී වීම
- කාලය සහ තත්ත්වය අනුව අනුගත වීමේ හැකියාවක් තීරණ ආධාරක පද්ධතිවලට පැවතීම.

තීරණ ආධාරක පද්ධති වල ප්‍රතිලාභ

- කාර්යක්ෂමතාව මෙන්ම තීරණ ගැනීමේ වේගය වැඩි දියුණු කිරීම.
- සමස්ත පාලනය ඉහළ තීරණ ගැනීම සඳහා ඇති හැකියාව ආදී වැඩි දියුණු කිරීම.
- අන්තර් පුද්ගල සන්නිවේදන ක්‍රම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- එය බොහෝවිට වැඩසටහන් ගත නොකළ තීරණ සඳහා භාවිතා වන බැවිනි සාමාන්‍ය වූ තීරණ ගැනීම් සඳහා නව සාධක සහ ආකෘතියෙන් හඳුනාගැනීම මේ මගින් සිදුවේ
- කළමණාකරන ක්‍රියාකාරීත්වය ස්වයංක්‍රීය ක්‍රමය සඳහා උපකාර වීම

තීරණ ආධාරක පද්ධතියක කොටස්

- දත්ත පදනම් කලමනාකරණ පද්ධති
- ආකෘති කලමනාකරණ පද්ධතිය
- උපකාරක මෙවලම්

ආකෘති කලමනාකරණ පද්ධතිය

- කළමනාකරුවන් විසින් භාවිතා කරනු ලබන ප්‍රවේශ ආකෘතීන් මෙහි ගබඩා කොට තබයි

උපකාරක මෙවලම්

- Support tools like online help, graphical analysis, error correction mechanism, facilitates better user interaction with the system

දත්ත පදනම් කලමනාකරණ පද්ධති

- ගැටළු විසඳීම සඳහා අවශ්‍ය වන දත්ත අභ්‍යන්තර හෝ බාහිර දත්ත පදනම් වලින් ලබාගත යුතුය
- අභ්‍යන්තර දත්ත ආයතනයේ පවතින ගනුදෙනු සැකසුම් පද්ධති කළමණාකරන සැකසුම් පද්ධති ආදියෙන් ලබාගත හැක
- බාහිර මූලාශ්‍ර ලෙස විවිධ පුවත්පත් වෙබ් පාදක හෝ මාර්ගගත දත්ත සේවාවන් දත්ත පදනම්

තීරණ ආධාරක පද්ධති වර්ග

තත්ව විමසුම් පද්ධති

- එය මෙහෙයුම් ළමනාකරණ මට්ටමේ හෝ මධ්‍ය කළමනාකරණ මට්ටම තීරණ ගැනීම සඳහා උපකාර වේ උදාහරණ ලෙස යන්ත්‍රසූත්‍ර සඳහා දෛනිකව ඇති වැඩකටයුතු පෙළගැස්ම.

දත්ත විශ්ලේෂණ පද්ධතිය

- මේ මගින් සංසන්දනාත්මක විශ්ලේෂණයන් ඉදිරිපත් කරයි.
- උදාහරණයක් ලෙස මූල්‍ය ප්‍රවාහ විශ්ලේෂණය, තොග විශ්ලේෂණය ආදිය පෙන්වා දිය හැක.

තොරතුරු විශ්ලේෂණ පද්ධතිය

- මෙම පද්ධතිය මගින් වාර්තා උත්පාදනය සඳහා දත්ත සහ තොරතුරු විශ්ලේෂණය කරනු ලබයි
- උදාහරණ ලෙස විකුණුම් විශ්ලේෂණය, ලැබිය යුතු ගිණුම් පද්ධතිය, වෙළඳපළ විශ්ලේෂණ ආදිය.

ගිණුම්කරණ පද්ධතිය

- එය ගිණුම්කරණය සහ මූල්‍ය සම්බන්ධ සියලු තොරතුරු නිරීක්ෂණය කරනු ලබයි
- උදාහරණ ලෙස අවසන් ගිණුම් ලැබිය යුතු ගිණුම්, ගෙවිය යුතු ගිණුම් ආදිය. මෙම පද්ධතිය මගින් ව්‍යාපාරය අවසන් අරමුණ පිළිබඳ නිරීක්ෂණය කරනු ලබයි.

MCVLearning
your virtual learning partner

JMC vLearning
"your virtual learning partner